ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
**ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk**
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **සන්නිවේදන දෙපාර්තමේන්තුව** |
| දිනය | **2018 මැයි 02** |

## ශ්‍රී ලංකා ආර්ථික ක්‍රියාකාරිත්වය සහ ඉදිරි ගමන පිළිබඳව විශ්වාසය විදේශ ආයෝජකයෝ තහවුරු කරති.

මෑත කාලයේදී ශ්‍රී ලංකා ආර්ථිකයෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳව දැඩි අවධානයක් යොමු වී තිබේ.

මෙවැනි වාතාවරණයක් තුල, ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළෙන් ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි පවතින සහයෝගයේ ස්වභාවය මැන බැලීම යෝග්‍ය වේ. ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළ මත පදනම්වන මිනුම් දඬු තාර්කික හා යථාර්ථවත් වන අතර මෙවැනි මිනුම් දඬු ශ්‍රී ලංකා ආර්ථිකයෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳව ස්වාධීන දර්ශක ලෙස සැලකිය හැකිය.

- ශ්‍රී ලංකාව මෑතකදී ඇමෙරිකානු ඩොලර් බිලියන 2.5 ක (ඉතිහාසයේ වැඩිම) අගයකින් යුතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ISB) සාර්ථකව නිකුත් කරන ලදී. එයට සියයට 2.6 ක අධි දායකත්වයක් ලැබී තිබුණි. ලොව විශාලතම සහ ඉහල පිළිගැනීමකින් යුතු යෝජනා අරමුදල් මේ සඳහා විශාල සහභාගිත්වයක් දක්වා තිබිණි.

- ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවෙන් පසු, දළ නිල සංචිත ඓතිහාසික වශයෙන් ඉහළම මට්ටම වන ඩොලර් බිලියන 9.9 දක්වා වැඩි වී ඇත.

- ඩොලර් බිලියනයක කාලීන ණයක් ලබා ගැනීම සඳහා යෝජනා කැඳවීමේදී රජයට ඉතා හිතකර ප්‍රතිචාරයක් ලැබී ඇත. ඒ අනුව මෙම කාලීන ණයෙහි ප්‍රමාණය ඉහල දමා, එමගින් ලැබෙන අරමුදල් භාවිතා කර, වඩා අධික පිරිවැයකින් යුතු වෙනත් ණය ගෙවා දැමීම කෙරෙහි රජයේ අවධානය යොමුව තිබේ.

- ඇමෙරිකා එක්සත් ජනපදයේ පොලී අනුපාතික ඉහල යාමත්, ගෝලීය මූල්‍ය අර්බුදයෙන් පසු ප්‍රථම වරට ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපය, සහ ජපානය යන ප්‍රධාන ආර්ථික කලාපයන්හි එකට සිදුවන ආර්ථික වර්ධනයත් හමුවේ, නැගී එන වෙළෙඳපොළවලින් අරමුදල් පිටතට ගලායාම මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකාවේ කොටස්

වෙළෙඳපොල සහ රජයේ රුපියල් සුරැකුම්පත් වෙළෙඳපොල වෙත ශුද්ධ වශයෙන් ගලා ඒම් පැවත ඇත.

- කොළඹ කොටස් වෙළෙඳපොල වෙත ප්‍රාථමික හා ද්විතියික වශයෙන් ආයෝජන සඳහා ඩොලර් මිලියන 9.6ක් මේ දක්වා ශුද්ධ ගලා ඒම් වශයෙන් පවතියි. 2017 වසරේදී මෙවැනි ගලා ඒම් ඩොලර් මිලියන 278.5ක් විය.

- රජයේ රුපියල් සුරැකුම්පත් වෙළෙඳපොල වෙත මේ දක්වා ශුද්ධ ගලා ඒම් ඩොලර් මිලියන 6.05කි. 2017 වසරේදී, මෙවැනි ගලා ඒම් ඩොලර් මිලියන 441ක් විය.

- 2017දී විදේශ සෘජු ආයෝජන ගලා ඒම් ඉතිහාසයේ වැඩිම අගයවූ ඩොලර් බිලියන 1.9ක් විය.

මීට අමතරව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකමෙහි 4වැනි සමාලෝචනය නිලධාරී මට්ටමේ එකඟතාවකට පැමිණ ඇති අතර, ස්වයංක්‍රීය ඉන්දන මිල සූත්‍රය අනුමත කිරීම මත, 2018 ජූනි මාසයේදී එහි පස්වැනි ණය වාරිකය ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 2017 ජූනි මාසයෙන් පසුව ශ්‍රී ලංකාවේ ආර්ථික ස්ථායීතාව හා ඉදිරි දැක්ම පිළිබඳව ධනාත්මක ප්‍රකාශ කිහිපයක්ම නිකුත් කර ඇත.
S&P සහ Fitch යන ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන දෙකම ශ්‍රී ලංකාවේ ඉදිරි දැක්ම සෘණ මට්ටමක සිට ස්ථාවර මට්ටමක් දක්වා වෙනක් කර ඇත.

මේ සියල්ලෙන් දැක්වෙන්නේ විදේශ ආයෝජකයන් විසින් ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරිත්වය සහ ඉදිරි ගමන පිළිබඳව ස්වාධීන විශ්ලේෂණයක් සිදු කර, එම ධනාත්මක හැඟීම මත ඔවුන් සතු මුදල් ශ්‍රී ලංකාවට ගලා ඒමට සලස්වා ඇති බවයි.

මෙම තත්ත්වය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා ශක්තිමත් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති, එනම් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව, විචක්ෂනශීලී මුදල් ප්‍රතිපත්ති, ආර්ථිකයෙහි තරඟකාරීත්වය සඳහා අනුබල දෙන නම්‍යශීලී විනිමය අනුපාතිකයන්, පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ.

එමෙන්ම සාධක වෙළෙඳපොල ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ වේගවත් කිරීමද, ආයෝජන පරිසරය වැඩිදියුණු කිරීමද, ආයෝජන ප්‍රවර්ධනය වේගවත් කිරීමද, විදේශ වෙළඳාම සඳහා පහසුකම් සැපයීමද, විදේශ වෙළඳාම පිළිබඳ සාකච්ඡා සම්පූර්ණ කිරීමද අත්‍යවශ්‍ය වේ.

තිරසාර ආර්ථික වර්ධනය සහ සංවර්ධනය සඳහා දේශපාලන ස්ථාවරත්වයද අත්‍යවශ්‍ය වේ.